*සැ. යු.* -(i) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2018 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරිසභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,087 - 2018 අගෝස්තු මස 31 වැනි සිකුරාදා - 2018.08.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1960 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1970 |

*සැ. යු.*- බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත 2018 අගෝස්තු මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 සැප්තැම්බර් මස 21 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 සැප්තැම්බර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතින්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු - හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතුය.

02. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතුය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05 කට නොඅඩු විය යුතුය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 ක් වූ අගෝස්තු මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| හම්බන්තොට | හම්බන්තොට | බඳගිරිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මාගම්පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට |
| හම්බන්තොට | අම්බලන්තොට | නැගෙනහිර අම්බලන්තොට කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා නැගෙනහිර ගිරුවාපත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට |

08 - 972

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න හා මරණ හා රෙජිස්ට්‍රාර් තනතුරු - ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතුය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතුය.

04. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න හා මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

05. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

06. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අගෝස්තු මස 10 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල නගරය නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

08-973

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු - මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතුය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතුය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම් කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතුය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වන දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අගෝස්තු මස 10 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදීය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | කඹුරුපිටිය | කඹුරුපිටිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා ගඟබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |
| මාතර | කොටපොල | උඩුවක කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා බටහිර මොරවක් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |
| මාතර | පිටබැද්දර | දංකොළුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා බටහිර මොරවක් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |

08 - 970

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය)
රෙජිස්ට්‍රාර් තනතුරු - කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතුය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතුය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය වියයුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතුය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අගෝස්තු මස 10 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදීය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | හොරණ | රයිගම් කෝරළය කොට්ඨාසයේ උඩුව ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |
| කළුතර | පානදුර | මහවිල කොට්ඨාසයේ උප්පැන්න මරණ හා කළුතර හා පානදුර තොටමූණ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |

08-975

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතුය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතුය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම් කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතුය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අගෝස්තු මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදීය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| හම්බන්තොට | තිස්සමහාරාමය | කිරින්ද කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට. |

08-971

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතුය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතුය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතුය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අගෝස්තු මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කළුතර | පානදුර | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ තොටවත්ත ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |

08-976

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතුය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතුය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතුය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අගෝස්තු මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මාතර | කිරින්ද පුහුල්වැල්ල | ගඟබඩ පත්තුව කිරින්ද ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාරයාලය, මාතර |

08-974

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ භාෂාවෙන් උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු - කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතුය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතුය.

04. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න හා මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

05. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

06. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 ක් වූ අගෝස්තු මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කොළඹ | තිඹිරිගස්යාය | කාසල් රෝහල ද ඇතුළත් කිරුළපන කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ |

08-948

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01 ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02 මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03 ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04 මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, විවාහ වී වසර 05 කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05 අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිළධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිළධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06 මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිළධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 ක් වූ අගෝස්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදීය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | කුලියාපිටිය නැගෙනහිර | කටුගම්පල හත්පත්තු (අරක්යාල) කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |
| කුරුණෑගල | රිදීගම | කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුව කොට්ඨාසයේ, තෙලඹුගල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |

08-1130

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු රත්නපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01 ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02 මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපාර්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03 ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04 විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05 අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිළධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය, ග්‍රාම නිළධාරි කාර්යාලය, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06 මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිළධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 ක් වූ අගෝස්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| රත්නපුර | කුරුවිට | පුස්සැල්ල කොට්ඨාසයේ, උප්පැන්න, මරණ හා කුරුවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |

08-1131

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය)
රෙජිස්ට්‍රාර් තනතුරු අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01 ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02 මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපාක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03 ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය.

04 විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, විවාහ වී වසර 05 කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05 අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිළධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය, ග්‍රාම නිළධාරි කාර්යාලය, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06 මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිළධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ඔක්තෝබර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අගෝස්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | කැකිරාව | කාංජනම්කුලම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා කළාගම් පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. |

08-1132

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### අධ්‍යාපන අමාත්‍යාංශය

### දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල ආගමික විෂයයන් ඉගැන්වීම සඳහා පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියට ධර්මාචාර්ය සමතුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල ආගමික විෂයයන් ඉගැන්වීම සඳහා පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසි ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම *ගැසට් නිවේදනය* අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.09.28 දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ."වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එමෙන්ම අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආගමික විෂයයන් ඉගැන්වීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 -II ශ්‍රේණියට ධර්මාචාර්ය සමතුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018" ලෙස අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය. තව ද විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතු ය.

*සටහන.*-අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

02. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

2.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය අනුව පළාත් පාසල්වල පවතින පුරප්පාඩු සඳහා පළාත් මට්ටමින් ද, ජාතික පාසල් සඳහා ජාතික මට්ටමින් ද පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 03 ගුණයක සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් වෘත්තීයේ දී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම සඳහා මෙම *ගැසට් නිවේදනයේ* 13.3 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ඇත. අයදුම්කරු විසින් ලිඛිත විභාගයේ දී සහ ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගන්නා මුලු ලකුණුවල ප්‍රමුඛතාවය මත පාසල් පාදක ක්‍රමය පදනම් කරගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.3 ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වීමට පෙර අයදුම්කරුවන්ට අදාළ පුරප්පාඩු ලේඛන ප්‍රදර්ශනය කරනු ලැබේ. ඒ අනුව අයදුම්කරුවන් විසින් එම අවස්ථාවේ දී පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්වකීය පත්වීම් ලබා ගැනීමට ඇති මනාපය අනුපිළිවෙළින් දැක්විය යුතු ය.

2.4 මෙම පුරප්පාඩු සඳහා බඳවාගනු ලබන්නේ පාසල් පාදක ක්‍රමය පදනම් කරගෙන වන බැවින් පත් කළ දින සිට වසර 05 ක් ගතවන තුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබාදෙනු නොලැබේ.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

(v) 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට ද එම සේවා ව්‍යවස්ථාවට මින් මතුවට සිදුකරනු ලබන සංශෝධනයන්ට ද රාජ්‍ය සේවයේ පත්වීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වනු ඇත.

04. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව GE 01-2016 හි රු. 27,740-300x6-380x7-445x2-රු.33,090/-(මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. එම පත්වීම්ලාභීන් මෙම වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු. 27,740/- වැටුපෙහි පිහිටුවනු ලැබේ. වැටුප් ගෙවීම සිදු කරනු ලබන්නේ එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් විධිවිධාන අනුව වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද පත්වීම්ලාභීන්ට හිමි ය.

05. අධ්‍යාපන සුදුසුකම් :

5.1 ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවේ සටහන 06 අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතු ය.

5.2 අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් (පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එකවර සමත් වී තිබිය යුතු ය.

5.3 ඉහත සුදුසුකම්වලට අමතරව අයදුම්පත් කැඳවන අවසාන දිනය වන 2018.09.28 දිනට පහත සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(*අ*) බුද්ධ ධර්මය විෂයය සඳහා බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත්වීම

(*ආ*) කතෝලික ධර්මය විෂයය සඳහා කතෝලික ධර්මාචාර්ය විභාගය සමත්වීම

(*ඇ*) ක්‍රිස්තියානි ධර්මය විෂයය සඳහා ක්‍රිස්තියානි ආගමික දැනුම පිළිබඳ ජාතික සහතික විභාගය සමත්වීම

(*ඈ*) හින්දු ධර්මය විෂයය සඳහා හින්දු ධර්මාචාර්ය විභාගය සමත්වීම

(*ඉ*) ඉස්ලාම් ධර්මය විෂයය සඳහා මෞලවි සහතිකය ලබා තිබීම

06. වයස් සීමාව:-

අයදුම්කරුවන් 2018.09.28 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු වියයුතු අතර, අවු. 35ට නොවැඩි විය යුතු ය.

07. අනෙකුත් අවශ්‍යතා :-

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

08. අයදුම්කිරීමේ ක්‍රමය :

8.1 අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් සකස් කර අයදුම්කරු විසින්ම පිරවිය යුතුය. 1 සිට 9 තෙක් වන ශීර්ෂ පළමුවන පිටුවේද,10 සිට ඉතිරි පිටුවලටද ඇතුළත් වන පරිදි තම අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් ද, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් ද, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්,අයදුම්පත යොමු කිරීමට ප්‍රථම අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කර ලදුපත අලවා තිබේද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන්න.(අයදුම්පතේ ඡායාපිටපතක් හා මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

8.2 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණක් වන අතර එය ජාතික පාසල් හෝ පළාත් පාසල් යන දෙවර්ගයෙන් එක් පාසල් වර්ගයක් සඳහා පමණක් විය යුතුය.අයදුම් කරනුයේ ජාතික පාසල් ද පළාත් පාසල් ද යන්න අයදුම්පතේ අදාළ කොටුව තුළ සඳහන් කළ යුතු අතර, එසේ නම් කරනු ලබන කැමැත්ත පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.පළාත් පාසල් අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් අයදුම් කරන පළාත තුළ වසර 03 ක ස්ථිර පදිංචිය තිබිය යුතුය.

8.3 අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. දැනට රාජ්‍ය සේවයේ සිටින විභාග අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු / විශ්‍රාමික නිලධාරියකු/කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/ පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

8.4 ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.5 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය.එසේ විමසීමේදී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය.අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් 0112784232 දරන ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

09. විභාගයට පෙනී සිටීම :

9.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කොට විභාග යට පෙනී සිටිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2 අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන, පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන* - අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් දැරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලබන අතර, විභාගය සමත්වීම පත්වීම ලැබීමට සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ.

10. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව* :

තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් එක් අනන්‍යතාපත්‍රයක් ඉදිරිපත් කළ යුතු යඃ

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියැදුරු බලපත්‍රය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

12. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :

12.1 මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පමණක් උපලේඛන අංක 05 හි සඳහන් නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල පමණක් පැවැත්වේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කර නොමැති නම්, එම අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක හෝ කොළඹ නගරයේ හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

12.2 සෑම අපේක්ෂකයෙකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ, එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට නියමිත භාෂා මාධ්‍යයම විය යුතු ය. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

12.3 ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 බැගින් ලබාගෙන විෂයයන් දෙකම සමත්විය යුතු ය.

13. *විෂය නිර්දේශය* :

මෙම විභාගය පහත 13.1 හා 13.2 යන ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත ය. සියලුම අයදුම්කරුවන් එම ප්‍රශ්න පත්‍ර දෙකම සඳහා පෙනී සිටීම අනිවාර්යය වේ.

13.1 *අභියෝග්‍යතා පරීක්ෂණය* - කාලය පැය 01 යි (ලකුණු 100 යි).

අයදුම්කරු සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

13.2 *සාමාන්‍ය දැනීම* - කාලය පැය 01යි. (ලකුණු 100 යි)

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

13.3 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය*

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

*ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු*

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

13.4 *ප්‍රායෝගික පරීක්ෂණය* -

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා විනාඩි 05 කට නොඅඩු කාලයක් ලබාදෙනු ලැබේ.මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

*ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු -*

ගුරු වෘත්තියේ දී වැදගත්වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලීම.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිෂ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලිබව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

14. *විභාග ගාස්තු :*

14.1 විභාග ගාස්තුව රුः 600/-කි. ආදායම් ශීර්ෂ අංක 20-03-02-13 යටතේ විභාග කොමසාරිස් ජනරාල් නමින් ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා අයදුම්කරුගේම නමට ලබා ගන්නා ලදුපත අයදුම් පතේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කරන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අය කිරීමක් සිදු නොකරන බවද කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

15. *විභාග ප්‍රතිඵල :*

ලිඛිත විභාගයේ මුලු ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය, විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exam.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

16. අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :

අයදුම්පත පිරවීමේ දී පහත උපලේඛන 1, 2, 3, 4 හා 5 පමණක් භාවිතා කරන්න.

උපලේඛන අංක 01

| *භාෂා මාධ්‍යය* | *කේත අංකය* |
|---|---|
| සිංහල මාධ්‍යය | 2 |
| දෙමළ මාධ්‍යය | 3 |

උපලේඛන අංක 02

| *විෂයය* | *කේත අංකය (සිංහල මාධ්‍ය)* | *කේත අංකය (දෙමළ මාධ්‍ය)* |
|---|---|---|
| බුද්ධ ධර්මය | 1.1 | 1.2 |
| කතෝලික ධර්මය | 2.1 | 2.2 |
| ක්‍රිස්තියානි ධර්මය | 3.1 | 3.2 |
| හින්දු ධර්මය | - | 4.2 |
| ඉස්ලාම් ධර්මය | 5.1 | 5.2 |

උපලේඛන අංක 03

| *පාසල් වර්ගය* | *කේත අංකය* |
|---|---|
| ජාතික පාසල් | 1 |
| පළාත් පාසල් | 2 |

උපලේඛන අංක 04

| පළාත | පළාත් කේත අංකය |
|---|---|
| බස්නාහිර පළාත | 01 |
| මධ්‍යම පළාත | 02 |
| උතුරු පළාත | 04 |
| සබරගමුව පළාත | 09 |

උපලේඛන අංක 05

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| යාපනය | 07 |
| මන්නාරම | 08 |
| වවුනියාව | 09 |
| මුලතිව් | 10 |
| කිලිනොච්චිය | 11 |
| බදුල්ල | 12 |
| මොණරාගල | 13 |
| රත්නපුර | 14 |
| කෑගල්ල | 15 |

පුරප්පාඩු ලේඛනය

| මාධ්‍යය | ජාතික / පළාත් | පළාත | බුද්ධ ධර්මය | කතෝලික ධර්මය | ක්‍රිස්තියානි ධර්මය | හින්දු ධර්මය | ඉස්ලාම් ධර්මය |
|---|---|---|---|---|---|---|---|
| සිංහල | ජාතික පාසල් | | ✓ | ✓ | ✓ | - | ✓ |
| | පළාත් පාසල් | 1.බස්නාහිර | ✓ | ✓ | - | - | ✓ |
| | | 2.මධ්‍යම | ✓ | - | ✓ | - | ✓ |
| | | 3.උතුර | ✓ | - | - | - | - |
| දෙමළ | ජාතික පාසල් | | - | ✓ | ✓ | ✓ | ✓ |
| | පළාත් පාසල් | 1.බස්නාහිර | ✓ | ✓ | - | ✓ | ✓ |
| | | 2.මධ්‍යම | - | ✓ | ✓ | ✓ | ✓ |
| | | 3.උතුර | - | ✓ | ✓ | ✓ | ✓ |
| | | 4.සබරගමුව | - | ✓ | ✓ | ✓ | ✓ |

17. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ අංක 13.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

18. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

19. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

20. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුවේ.

21. සිංහල හා දෙමළ භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි,<br>
ලේකම්.<br>
අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 අගෝස්තු මස 13 වැනි දින,<br>
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය<br>
පැලවත්ත, බත්තරමුල්ල<br>
.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

*අධ්‍යාපන අමාත්‍යාංශය*

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල ආගමික විෂයයන් ඉගැන්වීම සඳහා පවතින ගුරු පුරප්පාඩු සඳහා<br>
ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියට<br>
ධර්මාචාර්ය සමතුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2018

01. පුරප්පාඩු සඳහා අයදුම් කිරීම :

1.1 පුරප්පාඩු සඳහා අයදුම්කරන පාසල් වර්ගය (උපලේඛන අංක 3 භාවිතා කර අදාළ කේත අංකය කොටුව තුළ ලියන්න)

1.2 පුරප්පාඩු සඳහා අයදුම් කරන පළාත (උපලේඛන අංක 4 භාවිතා කර අදාළ කේත අංකය කොටුව තුළ ලියන්න)

1.3 විභාගය සඳහා පෙනී සිටීමට අයදුම් කරන නගරය (උපලේඛන අංක 5 භාවිතා කර අදාළ කේත අංකය කොටුව තුළ ලියන්න)

(එක් අයදුම්කරුවකුට ඉල්ලුම් කළ හැක්කේ ජාතික පාසල් හෝ පළාත් පාසල් යන දෙවර්ගයෙන් එක් පාසල් වර්ගයක් සඳහා පමණි.1.2 වගන්තිය ජාතික පාසල් අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

02 ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය සඳහා උපලේඛන 1 භාවිතා කර අදාළ කේත අංකය කොටුව තුළ යොදන්න.

භාෂා මාධ්‍යය :

03. ඉල්ලුම් කරනු ලබන විෂයය සඳහා විෂය ක්ෂේත්‍ර අංක අනුව නම් කරන්න.
(උපලේඛනය 2 භාවිතා කරන්න)

| විෂයය | විෂයය ක්ෂේත්‍ර අංකය |
|---|---|
| | |

04. 4.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා: AMARAKOON MUDIYANSELAGE NAMAL HERATH) :————.

4.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (උදා : HERATH A.M.N.) :————.

4.3 සම්පූර්ණ නම(සිංහලෙන් /දෙමළෙන්):-
:————.

05. වර්තමාන ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :————.

06. 6.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

6.2 ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

07. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 ☐
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. 8.1 විවාහක /අවිවාහක බව : අවිවාහක - 1 විවාහක - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

8.2 උපන් දිනය වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

8.3 2018.09.28 වැනි දිනට වයස : අවු. : ☐☐ මාස : ☐☐ දින : ☐☐

09. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :

| අ. පො. ස. (සා. පෙළ) විභාගය | | | | අ. පො. ස. (උ. පෙළ) විභාගය | |
|---|---|---|---|---|---|
| වර්ෂය :- | විභාග අංකය:- | | | වර්ෂය:- | විභාග අංකය:- |
| විෂයය | සාමර්ථය | විෂයය | සාමර්ථය | විෂයය | සාමර්ථය |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

10.0 සමත් වී ඇති බෞද්ධ ධර්මාචාර්ය විභාගය / කතෝලික ධර්මාචාර්ය විභාගය / ක්‍රිස්තියානි ආගමික දැනුම පිළිබඳ ජාතික සහතික විභාගය / හින්දු ධර්මාචාර්ය විභාගය / මෞලවී සහතික පත්‍ර විභාගය පිළිබඳව විස්තර ඃ

10.1 විභාගය සමත් වර්ෂය ඃ-

10.2 ප්‍රතිඵල වලංගු වන දිනය ඃ-

10.3 හදාරා ඇති විෂයයන් සාමාර්ථය ආයතනය

| හදාරා ඇති විෂයයන් | සාමාර්ථය | ආයතනය |
|---|---|---|
| ............................................ | ........................... | .................................................... |
| ............................................ | ........................... | .................................................... |
| ............................................ | ........................... | .................................................... |
| ............................................ | ........................... | .................................................... |

11.0 විභාග ගාස්තු ගෙවීම පිළිබඳව විස්තර ඃ

11.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :————.

11.2 කුවිතාන්සියේ අංකය :————.

11.3 නිකුත් කළ තැපැල්/උප තැපැල් කාර්යාලය :————.

11.4 දිනය :————.

මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න.
මුදල් ගෙවූ කුවිතාන්සිය නොගැලවෙන සේ එහි එක් දරයකින් මෙහි අලවන්න.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම, සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

12.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................................. මහතා /මහත්මිය /මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු /ඇය මා ඉදිරිපිටදී ............................... දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

13.0 අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ
........................................................................... මහතා / මහත්මිය/මෙනෙවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි.
ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/ අනියම් සේවකයකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව:- :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

08-1136

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධිකාරී (වාණිජ/ ගමනාගමන) 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017 (2018)**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සහකාර අධිකාරී (වාණිජ/ ගමනාගමන) 111 ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධිකාරී (වාණිජ/ගමනාගමන) 111 ශ්‍රේණිය සඳහා වේ.

02. අයදුම්පත් කැඳවන අවසාන දිනය 2018.09.28 වේ.

*සටහන.*- අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරාගත යුතුය.

*ලිඛිත විභාගය* .- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර තුන (03) කින් සමන්විත වේ:-

1. බුද්ධි පරීක්ෂණය
2. භාෂා හැකියාව
3. සාමාන්‍ය දැනීම

*විභාග දිනය.* - මෙම විභාගය 2018 දෙසැම්බර් මස දී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අමාත්‍යාංශ ලේකම්ට බලය ඇත.

*සම්මුඛ පරීක්ෂණය.*-ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තා වූ අයදුම්කරුවන් සම්බන්ධයෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණය පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

02. පත් කරනු ලබන සංඛ්‍යාව 12කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

03. සේවා කොන්දේසි.-

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/04-01-43/05/2016 හා 2017.01.26 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලටද, අංක 1589/30 හා 2009.02.20 වැනි දින දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, යටත්ව තෝරා ගනු ලබන අයදුම්කරුවකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

3.2 මෙම තනතුර ස්ථිරය.

3.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධිකාරී (වාණිජ/ ගමනාගමන) 111 වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

3.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

3.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාරගැනීමට අපොහොසත් වන හා හෝ පත්කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

04. *මාසික වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය රු. 47,615/- 10x1,335- 8x1,630-17x2,170- රු. 110,895/- (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛනයේ II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

05. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

(*අ*) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම, පිරිමි අයදුම්කරුවකු වීම;

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;

(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්තවීම;

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

*සටහන* - උපාධිය බලපවත්නා දිනය අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතුය.

(*ඈ*) *වයස*.- අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු විසිඑකට (21) නොඅඩු විය යුතු අතර, අවුරුදු තිස්පහට (35) නොවැඩි විය යුතුය. (ඒ අනුව 1997.09.28 දිනට හෝ ඊට පෙර හා 1983.09.28 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

*වෙනත්* :

(i) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(ii) කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.

06. *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු.1,200.00කි. එය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාග යක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

07. *අයදුම් කිරීමේ ක්‍රමය* :

(*අ*) අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත භාවිත කරමින් ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පතේ ශීර්ෂ අංක 1.0 සිට 2.12 තෙක් පළමුවන පිටුවට ද, 3.0 සිට 7.0 තෙක් එහි දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන පරිද්දෙන් තම අයදුම්පත සකස්කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. අයදුම්පතේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු අතර, ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද? යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇද්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතුය. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(*ආ*) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් තම අත් අකුරෙන්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍යය වේ.

(*ඇ*) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2018.09.28 දින හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස එවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව '' ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධිකාරී (වාණිජ/ගමනාගමන) 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017'' යනුවෙන් ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

(*ඈ*) අයදුම්පතේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු ද, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(*ඉ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(*ඊ*) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සටහන් කොට ඉල්ලීම්

ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තවද, විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම්ව තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. විභාගයට ඇතුළුවීම :

(අ) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත.

*සටහන* :
අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව* :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්-*
අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී සහ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

11. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

12 *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :-

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

(ඇ) අයදුම්කරුවකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් හා භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේදී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

(ඈ) ප්‍රධාන විෂයය එක් භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අයදුම්කරුවකු ප්‍රධාන විෂයයෙන් සාමර්ථ්‍ය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන* :(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති සුදුසුකම් ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 5 (ආ) ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.

(ii) අයදුම්කරුවකු විභාගයේදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) තම අයදුම්පතෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට ඉඩ දෙනු නොලැබේ.

13. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

13.1 ලිඛිත විභාගය :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුන (03) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 2. භාෂා හැකියාව | 100 | 40 |
| 3. සාමාන්‍ය දැනීම | 100 | 40 |

අයදුම්කරුවන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

13.2 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :*

(i) ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි. එහිදී සුදුසුකම් පරීක්ෂා කිරීමක් පමණක් සිදු කරන අතර ලකුණු ලබා දීමක් සිදු කරනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුව වන අතර බඳවාගනු ලබන්නේ ලිඛිත තරග විභාග යේදී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව වේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

*සැලකිය යුතුයි* .-සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගිවීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

13.3 විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

14. *ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :*

01. *බුද්ධි පරීක්ෂණය :*

අයදුම්කරුගේ තර්කානුකූල විශ්ලේෂණ ශක්තිය ද ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව ද තක්සේරු කිරීමට හැකි වන අයුරු, සංඛ්‍යාමය ගැටළු හා භාෂා ඛණ්ඩ, වගු යනාදිය ඇතුළත්ව පින්තූර හා ප්‍රස්තාර උපයෝගී කර ගනිමින් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. (කාලය පැය 01යි)

02. *භාෂා හැකියාව :*

භාෂාව හැසිරවීමේ දී ලබා ගත යුතු වියරණ, සාරංශ කිරීම්, අර්ථ නිරූපණ, නිරවුල් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ භාෂාව පිළිබඳ අවබෝධය මැන බැලීම අරමුණු කොටගෙන සකසන ලද කෙටි පිළිතුරු සැපයීම, රචනා හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. (කාලය පැය 02යි)

03. *සාමාන්‍ය දැනීම :*

ශ්‍රී ලංකාවේ සමාජ, දේශපාලන, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ද අයදුම්කරුගේ සාමාන්‍ය දැනීම පිරික්සීම සඳහා වූ බහුවරණ, කෙටි පිළිතුරු සැපයීම හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. (කාලය පැය 02යි)

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජී. එස්. විතානගේ,
ලේකම්,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

2018 ක් වූ ජූලි මස 19 වැනි දින,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.
07 වැනි මහල,
සෙත්සිරිපාය,
අදියර II,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධිකාරී (වාණිජ/ ගමනාගමන) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2017 (2018)

Open Competitive Examination for Recruitment to Executive Service Category of Grade III of Assistant Superintendent (Commercial/ Transportation) in Sri Lanka Railway Department – 2017 (2018)

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 පෞද්ගලික තොරතුරු :————.

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම් වල මුලකුරු පසුව ද යොදා නම : (උදා. GUNAWARDHANA, H. M. S. K.) :————.

2.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :————.

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 (අදාළ අංකය කොටුව
ස්ත්‍රී - 1 තුළ ලියන්න) ☐

2.7 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.8 විවාහක/අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
අවිවාහක - 1
විවාහක - 2 ☐

2.9 ජන වර්ගය (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)- ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.10 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

2.11 සුදුසුකම් සැපිරිය යුතු 2018.09.28 දිනට වයස :

අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

2.12 ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.0 උපාධිය ලද දිනය :————.
විශ්වවිද්‍යාලය/ ආයතනය :————.
ලියාපදිංචි අංකය :————.
බාහිර/අභ්‍යන්තර :————.
උපාධිය :————.
විෂයයන් :————.
පන්තිය :————.
ඉහළ/පහළ :————.
උපාධිය වලංගු දිනය :————.
විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

4.0 විභාග ගාස්තු ගෙවීම :
විභාග ගාස්තු
(i) ගෙවන ලද කාර්යාලය :————.
(ii) ගෙවූ මුදල :————. (iii) ගෙවූ දිනය :————.
(iv) ලදු පත් අංකය :————.

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |

5.0 අයදුම්කරුගේ සහතිකය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ................ හා ............................ වැනි දින දරන මුදල් තැන්පතු පත්‍රිකාව මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 7 (ඈ) පරිදි විය යුතුය)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ........ දින ඔහුගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

7.0 ආයතන ප්‍රධානියාගේ සහතිකයඃ (රාජ්‍ය/පළාත් රාජ්‍ය/ රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................. මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ....... ...........................ලෙස සේවය කරන අතර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශකර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

08 - 1030/2

---

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ සහකාර අධිකාරී (වාණිජ/ ගමනාගමන) 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය- 2017 (2018)**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සහකාර අධිකාරී (වාණිජ/ ගමනාගමන) 111 ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ සහකාර අධිකාරී (වාණිජ/ගමනාගමන) 111 ශ්‍රේණිය සඳහා වේ.

ලිඛිත විභාගය - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර තුන (03) කින් සමන්විත වේ. :-

1. බුද්ධි පරීක්ෂණය
2. භාෂා හැකියාව
3. දුම්රිය ආරක්ෂක නීති, දුම්රිය මෙහෙයුම් හා වාණිජ රෙගුලාසි

*විභාග දිනය.-* මෙම විභාගය 2018 දෙසැම්බර් මස දී පැවැත්වෙනු ඇත. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

02. පත්කරනු ලබන සංඛ්‍යාව 08කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වැනි වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

03. සේවා කොන්දේසි :

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/04-01-43/05/2016 හා 2017.01.26 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටියෙහි ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 හා 2009.02.20 වැනි දරන අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, යටත්ව තෝරා ගනු ලබන අයදුම්කරුවකු සේවයේ 111 ශ්‍රේණියට පත්කරනු ලැබේ.

3.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත, වැන්දඹු හා අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

3.3 මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධිකාරි (වාණිජ/ගමනාගමන) 111 ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

3.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

3.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාරගැනීමට අපොහොසත් වන හා/හෝ පත්කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

04. මාසික වැටුප් පරිමාණය :

2016.02.25 දිනැති 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය රු. 47,615/- 10 x 1,335- 8 x 1,630- 17 x 2,170- රු. 110,895/- (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උප ලේඛනයේ II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

05. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම

(ආ) පළපුරුද්ද:

(i) දුම්රිය ස්ථානාධිපති සේවයේ 1 ශ්‍රේණියේ දුම්රිය ස්ථානාධිපති හෝ 1 ශ්‍රේණියේ දුම්රිය නියාමක තනතුරක වසර පහ (05) කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම.

හෝ

(ii) විමර්ශන නිලධාරි/පරීක්ෂක ප්‍රවාහන/දිස්ත්‍රික් පරීක්ෂක (ප්‍රවාහන හා වාණිජ)/ දුම්රිය ස්ථාන අධිකාරි/ බඩු ගබඩා නියෝජිත/ බඩු ගබඩා පාලක/ අංගනාධිපති/ ප්‍රධාන දුම්රිය පාලක/දුම්රිය ස්ථානාධිපති (අධි ශ්‍රේණිය), ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති/ නියාමක (අධි ශ්‍රේණිය), දුම්රිය නියාමක කාර්ය භාර්ය නිලධාරි, දුම්රිය නියාමක (විශේෂ), නියාමක පරීක්ෂක, නියාමක පරීක්ෂණ (විශේෂ) තනතුරක නිලධාරියකු වීම.

***සටහන.***- නව බඳවා ගැනීම් පරිපාටියකට අන්තර්ග්‍රහණය වන තෙක් විමර්ශන නිලධාරි/ පරීක්ෂක ප්‍රවාහන/බඩු ගබඩා නියෝජිත/ නියාමක පරීක්ෂක යන තනතුරුවල නිලධාරින්ට ද මේ සඳහා අයදුම්කළ හැක.

වෙනත් :

(i) අයදුම්පත් කැඳවීමේ දිනට පූර්වාසන්න පස් (05) අවුරුදු සතුටුදායක හා සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iii) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස අදාළ නොවේ.

06. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු.1,200.00කි. එය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක්

දාරයක් මඟින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

07. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත භාවිත කරමින් ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පතේ ශීර්ෂ අංක 1.0 සිට 2.12 තෙක් පළමුවන පිටුවට ද, 3.0 සිට 7.0 තෙක් ශීර්ෂ එහි දෙවන පිටුවට ද, ඇතුළත් වන පරිද්දෙන් තම අයදුම්පත සකස්කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇද්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.

(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් තම අත් අකුරෙන්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශය වේ.

(ඇ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2018.09.28 දිනට පෙර යැවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව ''ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ සහකාර අධිකාරි (වාණිජ/ ගමනාගමන) III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය- 2017'' යනුවෙන් ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

(ඈ) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාග සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස් වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැනි කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ඊ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තරය සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම්ව තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. විභාගයට ඇතුළුවීම :

(අ) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන්ට වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවාගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටි දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු නීති මාලාවත් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීති උල්ලංඝනය කළ හොත් විභාග

කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත.

(ඈ) *අත්සන සහතික කිරීම:* "අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර ගත යුතුය.

***සටහන*** **:**
අයදුම්කරුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව* :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් හෝ ඉදිරිපත් කළ යුතු ය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

11. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

12. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

***සටහන*** : (1) අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(2) තම අයදුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට අවසර දෙනු නොලැබේ.

13. *බඳවා ගැනීමේ ක්‍රමය-*

13.1 *ලිඛිත විභාගය* :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුන ( 03) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 2. භාෂා හැකියාව | 100 | 40 |
| 3. දුම්රිය ආරක්ෂක නීති, දුම්රිය මෙහෙයුම් හා වාණිජ රෙගුලාසි | 100 | 40 |

අයදුම්කරුවන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

13.2 *යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය* :

මෙම නිවේදනයේ 13.1 ඡේදය අනුව ලිඛිත තරග විභාගයට පෙනී සිට සමත් වූ අයදුම්කරුවන්ගෙන් ඉහළට කුසලතා දැක් වූ අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන සංඛ්‍යාවක් තෝරා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ඇත. ලිඛිත හා යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණුවල එකතුව පදනම් කර කුසලතා අනුපිළිවෙලට සකස් කළ අවසන් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දීමෙන් අනතුරුව විභාගයට පෙනීසිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exmas.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

| *විෂය ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 02. ජ්‍යෙෂ්ඨතාව | 70 |
| එකතුව | 100 |

13.3 එහි විස්තරාත්මක ලකුණු ලබා දීමේ පරිපාටිය පහත පරිදි වේ.

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | සලකා බලන උපක්ෂේත්‍රයන් | | ලබාදෙන ලකුණු ප්‍රමාණය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | උපාධියක් සඳහා | | ලකුණු 15 | 30 |
| | පශ්චාත් උපාධියක් සඳහා | | ලකුණු 10 | |
| | ඉහත උපාධිය හෝ පශ්චාත් උපාධිය ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළතාවය මත | | ලකුණු 05 | |
| ජ්‍යෙෂ්ඨතාව සඳහා | පළමු පන්තියේ වසර පහ (05) ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දුම්රිය ස්ථානාධිපති සේවයේ හෝ දුම්රිය නියාමක සේවයේ නිලධාරියකු සුදුසුකම් ලැබීමෙන් පසුව වූ සතුටුදායක සේවා කාලයකට | වසරකට | ලකුණු 04 බැගින් | 70 |
| | | වසරකට අඩු මාස 06ට වැඩි කාලයට | ලකුණු 02 බැගින් | |
| | | මාස 06ට අඩු මාස 03ට වැඩි කාලයට | ලකුණු 01 බැගින් | |
| | විමර්ශන නිලධාරි/ පරීක්ෂක ප්‍රවාහන/ දිස්ත්‍රික් පරීක්ෂක (ප්‍රවාහන හා වාණිජ)/ දුම්රිය ස්ථාන අධිකාරි/ බඩු ගබඩා නියෝජිත/ බඩු ගබඩා පාලක/ අංගනාධිපති/ ප්‍රධාන දුම්රිය පාලක/දුම්රිය ස්ථානාධිපති (අධි ශ්‍රේණිය), ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති/ නියාමක (අධි ශ්‍රේණිය), දුම්රිය නියාමක කාර්ය භාර්ය නිලධාරි, දුම්රිය නියාමක (විශේෂ), නියාමක පරීක්ෂක, නියාමක පරීක්ෂක (විශේෂ) යන තනතුරක නිලධාරියකු සුදුසුකම් ලැබීමෙන් පසුව වූ සතුටුදායක සේවා කාලයකට | වසරකට | ලකුණු 06 බැගින් | |
| | | වසරකට අඩු මාස 06ට වැඩි කාලයට | ලකුණු 03 බැගින් | |
| | | මාස 06ට අඩු මාස 03ට වැඩි කාලයට | ලකුණු 01 1/2 බැගින් | |

*සැලකිය යුතුයි.-* සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14. *ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :*

01. *බුද්ධි පරීක්ෂණය :*

අයදුම්කරුගේ තර්කානුකූල විශ්ලේෂණ ශක්තිය ද ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව ද තක්සේරු කිරීමට හැකි වන අයුරු, සංඛ්‍යාමය ගැටළු හා භාෂා ඛණ්ඩ, වගු යනාදිය ඇතුළත්ව පින්තූර හා ප්‍රස්තාර උපයෝගී කර ගනිමින් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. (කාලය පැය 01යි)

02. *භාෂා හැකියාව :*

භාෂාව හැසිරවීමේ දී ලබා ගත යුතු ව්‍යාකරණ, සාරාංශ කිරීම්, අර්ථ නිරූපණ, නිරවුල් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ භාෂාව පිළිබඳ අවබෝධය මැන බැලීම අරමුණු කොටගෙන සකසන ලද කෙටි පිළිතුරු සැපයීම, රචනා හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. (කාලය පැය 02යි)

03. *දුම්රිය ආරක්ෂක නීති, දුම්රිය මෙහෙයුම් හා වාණිජ රෙගුලාසි*

දුම්රිය ආරක්ෂක නීති, දුම්රිය වාණිජ රෙගුලාසි, දුම්රිය ගිණුම් උපදෙස් හා දෙපාර්තමේන්තු උපදෙස් සංග්‍රහය ආශ්‍රිතව අයදුම්කරුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ රචනා හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. (කාලය පැය 02යි).

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජී. එස්. විතානගේ,
ලේකම්,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

2018 ජූලි මස 19 වැනි දින,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
07 වෙනි මහල,
සෙත්සිරිපාය,
අදියර II,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ සහකාර අධිකාරී (වාණිජ/ ගමනාගමන) 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය- 2017 (2018)

**Limited Competitive Examination for recruitment to Executive Service Category of Grade III of Assistant Superintendent (Commercial/ Transportation) in Sri Lanka Railway Department – 2017 (2018)**

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 පෞද්ගලික තොරතුරු :————.

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම : (උදා. GUNAWARDHANA, H. M. S. K):
:————————————.

2.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :————————————.

2.4 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.

2.5 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————————————.

2.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :————————————.

2.7 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 අදාළ අංකය කොටුව තුළ ලියන්න

2.8 ජාතික හැඳුනුම්පත් අංකය :

2.9 විවාහක/අවිවාහක බව : අදාළ අංකය කොටුව තුළ ලියන්න
අවිවාහක - 1
විවාහක - 2

2.10 ජන වර්ගය (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)-
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.11 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

2.12 ජංගම දුරකථන අංකය :

3.0 ඔබ . . . . . . . . . දිනට වූ සේවයට/ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත්වූ භාෂාව සඳහන් කරන්න. . . . . . . . . .

4.0 (i) *ගැසට්* නිවේදනයේ 05 වැනි ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබේද ? :————.

(අ) ................................ දිනට වයස ෘ

(ආ) පළපුරුද්ද: *ගැසට්* නිවේදනයේ 05 (ආ) ඡේදය අනුව සුදුසුකම් ලබන්නේ, 05 (ආ) i / (ආ) ii යන ඒවායින් කුමක් ද ? යන්න :————.

(ii) දැනට දරන තනතුර :————.

(iii) ශ්‍රේණිය :————.

(iv) තනතුරට පත්වූ දිනය :————.

(v) එම තනතුරේ ස්ථිර කළ දිනය :————.

(vi) වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය :————.

(vii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

(ii) *ගැසට්* නිවේදනයේ 05 වැනි ඡේදේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අනුමත තනතුරක සේවයේ නියුතු සේවාවේ/ශ්‍රේණියේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු . . . . . . . . . දිනට සක්‍රිය හා සතුටුදායක මුළු සේවා කාලය ෘ :————.

5.0 විභාග ගාස්තු ගෙවීම ෘ

විභාග ගාස්තු

(i) ගෙවන ලද කාර්යාලය :——————.

(ii) ගෙවූ මුදල :————. (iii) ගෙවූ දිනය :————.

(iv) ලදු පත් අංකය :————.

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |

6.0 අයදුම්කරුගේ සහතිකයඃ

.................................. දිනට පූර්වාසන්නයේ හෝ වයස අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියෙක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල විසින් උපයාගෙන ඇති බවත්, *ගැසට්* නිවේදනයේ 05ආ ඡේදයට අනුව .................... දිනට සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. තවද, විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

*ගැසට්* නිවේදනයේ සඳහන් සියළුම නීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පටිපාටිය අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයඃ (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................ මයා/මිය/මෙනවිය ...................... තනතුරක සේවය කරන බවද, ........................ දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ පැවැත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ /ඇයගේ වේතනාධික සියල්ල උපයා ගෙන ඇති බවද, එම කාල සීමාව තුළ වරදකට (අවවාද කිරීම හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බවද, *ගැසට්* නිවේදනයේ 05 ආ ඡේදයට අනුව අවුරුදු ....................... (පහක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවද, අදාළ *ගැසට්* නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත අත්සන් කළ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :————;
පදවි නාමය :————;
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

08 - 1030/1

## සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### වෛද්‍ය කර්මය සඳහා වූ හෙද, පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවේ පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2018

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ හෙද, පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවේ පහත සඳහන් පාඨමාලාවන් සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් කළ හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ්අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

| සංකේත අංකය | සේවාව | පුහුණු පාඨමාලාවේ නම | පුහුණු කාලසීමාව | පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය |
|---|---|---|---|---|
| 01 | හෙද | හෙද නිලධාරි | වසර 03 | ඉංග්‍රීසි |
| 02 | පරිපූරක වෘත්තීන්ගේ සේවාව | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | වසර 02 | ඉංග්‍රීසි |
| 03 | | ඖෂධවේදී | වසර 02 | ඉංග්‍රීසි |
| 04 | | වෘත්තීය චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |
| 05 | | විකිරණ ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |
| 06 | අතුරු වෛද්‍ය සේවාව | පාසල් දන්ත චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |
| 07 | | සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරි | වසර 02 | ඉංග්‍රීසි |
| 08 | | අක්ෂි තාක්ෂණවේදී | වසර 02 | ඉංග්‍රීසි |
| 09 | | අංගාදේශක හා සෘජුකරණඥ | වසර 03 | ඉංග්‍රීසි |
| 10 | | මහජන සෞඛ්‍ය පරීක්ෂක | වසර 1 1/2 | සිංහල, දෙමළ |
| 11 | | බන්තු රේඛන ශිල්පී | වසර 01 | ඉංග්‍රීසි |
| 12 | | විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු | වසර 01 | ඉංග්‍රීසි |

අංක 01 වගුව

02. *අධ්‍යාපන හා තනතුරට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් :-*

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස (සා. පෙළ) සුදුසුකම් | අ.පො.ස (උ. පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | හෙද නිලධාරි | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | 2016 හා 2017 යන වර්ෂ වලින් එකක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජෛවීය විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03ක් හදාරා සියලුම විෂයයන්ගෙන් එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර);<br><br>හෝ<br><br>2016 හා 2017 යන වර්ෂ වලින් එකක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 28ට නොවැඩි විය යුතු ය.<br><br>උස අඩි 04 යි, අඟල් 10 කට (147.3 CM) නොඅඩු විය යුතු ය.<br><br>අවිවාහක විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස (සා. පෙළ) සුදුසුකම් | අ.පො.ස (උ. පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | 03ක් හදාරා සියළුම විෂයයන්ගෙන් එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) | |
| 02. | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත් වීම. | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |
| 03. | ඖෂධවේදී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත් වීම. | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපාක්ෂයටම අයදුම් කළ හැකි ය. |
| 04. | වෘත්තීය චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත් වීම. | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |
| 05. | විකිරණ ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත් වීම. | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |
| 06. | පාසල් දන්ත චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවකරට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව විෂයට සම්මාන** සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස (සා. පෙළ) සුදුසුකම් | අ.පො.ස (උ. පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| | | ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) සමත් වීම. | දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | අයදුම්කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි.<br><br>උස අඩි 4 යි, අඟල් 10ක් හෝ ඊට වැඩි විය යුතු ය. (147.3 CM)<br><br>සියලුම අයදුම්කාරියන් අවිවාහක විය යුතු ය. |
| 07. | සෞඛ්‍ය කීට විද්‍යා නිළධාරි | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවකරට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) සමත් වීම. | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව විෂයට සම්මාන** සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>අයදුම්කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි. |
| 08. | අක්ෂි තාක්ෂණවේදී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවකරට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) සමත් වීම. | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |
| 09. | අංගාදේශක හා සෘජුකරණඥ | දෙවරකට නොවැඩි වාර ගණනකදී විද්‍යාව, ගණිතය, **ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව** විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව/ ජීව විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |
| 10. | මහජන සෞඛ්‍ය පරීක්ෂක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවකරට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) සමත් වීම. | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය** විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>අයදුම්කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි.<br><br>උස අඩි 5 යි, අඟල් 2ක් හෝ ඊට වැඩි විය යුතු ය. (157.46 cm) |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස (සා. පෙළ) සුදුසුකම් | අ.පො.ස (උ. පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාල වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 11. | බන්තු රේඛන ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවකරට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) සමත් වීම. | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් දෙක (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |
| 12. | විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවකරට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) සමත් වීම. | 2016 හා 2017 යන වර්ෂවලින් එකක දී අ.පො.ස. (උ. පෙළ) විභාග යෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, යන විෂයයන් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2018.09.21 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |

3. *පාඨමාලාවන්ට අදාල සුවිශේෂී කරුණු :*

3.1 සිසු හෙද පුහුණුවට අදාල කරුණු :-

3.1.1 සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීම අංක 1837/8 හා 2013.11.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාවට හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් සිදුකරනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම් කරගනිමින් සිදුකරනු ලැබේ.)

3.1.2 දිවයිනෙන් සිසු හෙද පුහුණුවට බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.1.3 ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව අදාල දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම්කර අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති හෙද සේවයට අයදුම්කර තිබෙන මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.1.4 ඉන්පසු එම එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම වර්ෂයේ ජෛවීය විද්‍යා විෂය ධාරාව හා භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ හෙද සේවයට අයදුම්කර අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවට සාමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂවලට අදාළ එක් එක් විෂය ධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.1.5 එලෙස එක් එක් වර්ෂයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% ක් පිරිමි අයදුම්කරුවන්ගෙන් ද, 95%ක් ගැහැණු අයදුම්කරුවන්ගෙන් ද සමන්විත වන ලෙස එක් එක් වර්ෂයන්හි එක් එක් විෂය ධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් පුහුණුවට බඳවා ගනු ලැබේ.

3.2 *පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවේ පාඨමාලා සඳහා අදාල කරුණු :-*

3.2.1 පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවේ තනතුරුවලට බඳවා ගැනීමේ පරිපාටිවල හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම සිදුකරනු ලබන අතර, අයදුම්කරුවන්ගේ අ.පො.ස. (උ.පෙළ) Z අගය පදනම් කරගෙන පුහුණු පාඨමාලාවට බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

3.2.2 දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.2.3 ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම්කර අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.3 *පොදු කරුණු :-*

3.3.1 ශ්‍රී ලංකික පුරවැසියෙකු විය යුතු ය.;

3.3.2 සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශයක සේවය ලබාදීම සඳහා අන් සෑම අයුරකින් ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

3.3.3 තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.3.4 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

3.3.5 මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

3.3.6 පුහුණුවෙන් පසු මධ්‍යම රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් ලද හොත් ඔබ අවම වශයෙන් වසර 10ක් වත් සේවය කිරීමට කැමති විය යුතු ය.

3.3.7 තමන් අයදුම්කරුන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2018.09.21 වැනි දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය. පදිංචිය සනාථ කිරීමට පහත ලේඛනවලින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

(i) 2018.09.21 වැනි දිනට පූර්වාසන්න වසර 03 ක් තුළ ඔබ එම දිස්ත්‍රික්කය තුළ අඛණ්ඩව පදිංචි වී සිටිය යුතු ය. ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ ග්‍රාම නිළධාරි සහතිකය;

(ii) දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබාගත් පූර්වාසන්න වසර 03ක ඡන්ද හිමි නාම ලේඛනවල උපුටන.

*සටහන :-*

යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ විවාහ වීම මත හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අපේක්ෂකයකුට පූර්වාසන්න වසර 03 තුළ පදිංචිය සනාථ කළ නොහැකි අවස්තාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කළහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලැබේ.

3.3.8 යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව දිවයිනේ සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදාහරිනු ලැබේ.

4. *වෙනත් කරුණු :*

4.1 මෙම පාඨමාලාවෙන් පූර්ණකාලීන පාඨමාලාවන් වේ. එබැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙ යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතු ය. යමෙකු එසේ අයදුම් කර, පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අය කර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා පහත දක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය. (4.2) සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පඨාමාලාවල ලියාපදිංචි වී සිටින අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨාමාලාවක් සඳහා ලියාපදිංචි ව සීටියේ නම් හෝ සිටින්නේ නම්, මෙම පාඨමාලාවට ලියාපදිංචි කරනු ලබන දිනය වන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතු ය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචි සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුව ද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින්, එවැනි අයදුම්කරුවන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය. අවශ්‍ය අවස්ථාවලදී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතු ය.

4.3 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතු ය.

4.4 2018.09.21 වැනි දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද, යම් හෙයකින් ඉහත පුහුණු පාඨාමාලාවන් සඳහා ලියාපදිංචි කරන දින වන විට ලියාපදිංචි වී සිටියේ නම් ඔහු/ඇය ද උසස් පුහුණු පාඨමාලාවන් සඳහා ලියාපදිංචිය ලබා ගැනීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කර ගත යුතු ය.

4.5 සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨාමාලාවල ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන් වේ නම් ඔවුන් පුහුණුවට තේරී පත්වුව හොත් ඒ වනවිට ලබමින් සිටි පුහුණුවට අදාළව අත්සන් කර

තිබෙන ගිවිසුම් වලට අනුව ගිවිසුම්ගත මුදල හා ඒ වන විට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් ඉහත පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

4.6 ඉහත කොන්දෙසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන් ම ඔබ අයදුම් කරන පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට් නිවේදනයේ* කුමන හෝ වගන්තියක් මගින් හෝ අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහි තබා ගත යුතු ය. එමෙන් ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

4.7 අධ්‍යාපන සුදුසකම් හා අනෙකුත් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2018.09.21 වැනි දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5. *අයදුම්කළ යුතු ක්‍රමය* :

5.1 ඉහත පුහුණු පාඨමාලාවන් සඳහා අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ්අඩවියේ අදාළ කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කර එවිය යුතු ය. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් එකී විද්‍යුත් අයදුම්පතෙහි ද දක්වා ඇත.

5.2 අයදුම්පතේහි නිසි ස්ථානයේ ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි ඡයා පිටපතක් උඩගත කළ යුතු ය. (UPLOAD)

5.3 ඔබ පාඨමාලාවන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා අයදුම් කරන්නේ නම්, වෙබ්අඩවියේ දක්වෙන අයදුම්පතෙහි ඔබගේ මනාපය අනුව ප්‍රමුඛතා අනුපිවෙලට ඒ ඒ පාඨමාලාව තෝරාගත යුතු ය. අයදුම්කරුවන් පළමුව තේරී පත්වන පාඨමාලාවට ඇතුළත් විය යුතු අතර, ඔවුන්ට ඊළඟ පාඨමාලාවකට ඇතුළත් වීමට හෝ වෙනත් පාඨමාලාවකට මාරුවීමට හෝ අවස්ථාව ලබා දෙනු නොලැබේ.

5.4 අයදුම්කරුවන් රු.500.00ක මුදලක් ලංකා බැංකුව, තැපොබෙන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, විභාග ගාස්තු රැස්කිරීම ගිණුමට ගෙවිය යුතු ය. ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීම් කළ හැකි ය. මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩම දෙනු නොලැබේ. මෙලෙස මුදල් බැංකුවට තැන්පත් කර ලබාගන්නා ලද ලදුපත, අයදුම්පතේ අදාළ ස්ථානයේ උඩගත කළ යුතු ය. (UPLOAD)

5.5 මෙලෙස ඔබ විසින් සාර්ථක උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (PRINT OUT) ලබාගෙන එහි අදාළ ස්ථානයේ ඔබගේ අත්සන යොදා අත්සන සහතික කරවා ගත යුතු ය. (7 වැනි කොටස බලන්න.)

5.6 ඔබ විසින් උඩගත කරන ලද (UPLOAD) විද්‍යුත් අයදුම්පතෙහි මුද්‍රිත පිටපතේ අවසාන පිටුවේ නම් කර ඇති බාර් කෝඩ් (BAR CODE) කිහිපයක් මුද්‍රණය වී ඇත. එම බාර් කෝඩ්වලට කිසිදු හානියක් නොවන පරිදි කපා, පහත දක්වෙන (අංක 06) ඇමුණුම්වල මුල් පිටුවේ ඉහල දකුණු කෙළවරේ අදාළ බාර් කෝඩය පමණක් ඇලවිය යුතු ය. (එක් ලේඛනයක් සඳහා නම් කර ඇති පිරිදි එක් බාර් කෝඩයක් පමණක් ප්‍රමාණවත් වේ.)

*සටහන* :-

I. අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී ඔබට යම් ගැටළුවක් ඇති වුව හොත් ඒ සම්බන්ධයෙන් සතියේ වැඩකරන දින පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 අතර කාලය තුළ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකතන අංක 0112 693 955 ඇමතීමෙන් මේ සම්බන්ධයෙන් උපදෙස් ලබාගත හැකි ය.

II. එමෙන් ම, සතියේ වැඩකරන දින පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා කාලය තුළ ඔබ පදිංචි දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සැලසුම් අංශයේ අදාළ නිලධාරින් හමුවීමෙන් ද මේ සම්බන්ධයෙන් උපදෙස් ලබාගත හැකි ය.

6. *ඇමුණුම්* :-

6.1 උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක්;

6.2 අ.පො.ස. (උ. පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දක්වෙන සහතිකයේ සහතික කරන ලද පිටපතක් ;
***සටහන*** :- විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු ලැබේ.

6.3 අ.පො.ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය/ලේඛනවල සහතික කරන ලද පිටපතක්;
***සටහන*** :- විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු ලැබේ.

6.4 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ රියදුරු බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක්.

6.5 බැංකුවට මුදල් ගෙවූ ලදුපතේ සහතික කරන ලද පිටපතක්.

6.6 පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකයේ (ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ නොහැකි අවස්තාවල දී පමණක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබාගත් පූර්වාසන්න වසර 03ක ඡන්දහිමි නාම ලේඛනවල උපුටන ඉදිරිපත් කළයුතු ය.) පිටපතක් ;

6.7 ඔබ විසින් අත්සන සහතික කරගන්නා ලද මුද්‍රිත අයදුම්පතද නිසි පරිදි බාර් කෝඩ් (BAR CODE) අලවන ලද ඉහත දක්වෙන ඇමුණුම් ද ලිපි කවරයක බහා එහි ඉහල වම් කෙළවරේ "හෙද පරිපූරක සහ අතුරු වෛද්‍ය සේවාවන් හි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2018" සහ ඔබ අයදුම්කරන දිස්ත්‍රික්කය ද සඳහන් කර 2018.09.21 වැනි දිනට පෙර ප්‍රධානී, මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකය, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
*සටහන* :- අදාළ සහතිකවල පිටපත් සත්‍ය බවට තමා විසින්ම සහතික කළයුතු ය. සියළුම ඡායා රූප පිටපත් A4 ප්‍රමාණයේ විය යුතු ය.

7. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :-

7.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විශ්වයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 334,452.00කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතු ය.

7.2 රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය. එමෙන්ම, මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබා ගතයුතු ය.

7.3 අයදුම්පත් තැපෑලෙන් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

7.4 නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පතක් භාර ගනු නොලැබේ.

7.5 මෙම නිවේදනයේ දක්වෙන නියමයන්ට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සම්මුඛ පරීක්ෂණයකට ඔබ කැඳවුම් ලැබුවහොත් ඔබ විසින් ඉදිරිපත් කළ යුතු තොරතුරු :-

8.1 ඔබ විසින් සාර්ථකව උඩගතකර ඇති විද්‍යුත් අයදුම්පත සහ ලියාපදිංචි තැපෑලෙන් නියමිත දිනට පෙර එවන ලද අත්සන සහතික කරනු ලැබූ අයදුම්පත අනුව අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සේවා ව්‍යවස්ථාවේ හා මෙම *ගැසට්* නිවේදනයේ එක් එක් තනතුරු වෙනුවෙන් දක්වා ඇති සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලිපිලේඛනයන්හි *මුල් පිටපත්* ඉදිරිපත් කළ යුතු ය.

8.2 විද්‍යුත් මාධ්‍යයෙන් උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත (ඔබගේ අත්සන සහතික කරන ලද).

8.3 උප්පැන්න සහතිකය.

8.4 අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දක්වෙන සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

8.5 අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

8.6 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්මේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.

8.7 බැංකුවට මුල් ගෙවූ ලදුපත.

8.8 ඉහත දක්වෙන පරිදි පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය. (ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවල දී පමණක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබාගත් පූර්වාසන්න වසර 03 ක ඡන්දහිමි නාම ලේඛනවල උපුටන ඉදිරිපත් කළ යුතු ය.)

8.9 අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චකරුවෙකු ඉදිරියේ රු. 50.00ක මුද්දරයක් මත අත්සන් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශයක් (මෙය හෙද සහ පාසල් දන්ත චිකිත්සක පුහුණුවට අයදුම් කරන අයදුම්කරුවන්ට හා අයදුම්කාරියන්ට පමණක් අදාළ වේ.)

8.10 විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ /සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පාඨමාලාවක ලියාපදිංචි වී හෝ සහභාගි නොවන බවට ඔබගේ බහුමාන සහතිකය.

*සටහන* :-

(අ) තවද, ඉහතින් සඳහන් (8.3) සිට (8.7) දක්වා ලේඛනයන්හි මුල් පිටපත්වලට අමතරව සත්‍ය බවට තමා විසින්ම සහතික කරන ලද ඡයා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී රැගෙන ආ යුතු ය.

(ආ) පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර එස් තේරුම් ගත යුතු ද නොවේ.

(ඈ) සම්මුඛ පරීක්ෂයෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු http:// www.health.gov.lk වෙබ්අඩවියේ පළකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

9. *පුහුණු කිරීමේ පරිපාටිය* :-

9.1 සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතුරින් තෝරා ගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අදාළ පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුලත් කරනු ලැබේ. පාඨමාලා කාලය සහ හැදෑරිය යුතු මාධ්‍යය අංක I වගුවේ දක්වා ඇත.

9.2 පුහුණු පාසල්වලට ඇතුලත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බලපැවැල්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

9.3 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවාගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට හෙළි වුවහොත් හෝ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

9.4 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ ද අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛනවල V හි විධිවිධාන වලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

9.5 පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම ලදහොත් අවම වශයෙන් වසර දහයක (10) කාල පරිච්ඡේදයක් රාජ්‍ය සේවය යටතේ/පළාත් රාජ්‍ය සේවය යටතේ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. ඉහත 9.3 කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැර ගියහොත්, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදු වුවහොත් හෝ පත්වීම ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් ඉහත පරිදි අදාළ, තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළ දී ඔහුට/ ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියදම් හා ගිවිසුම්ගත මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අය කර ගැනීමට ගිවිසුම් ප්‍රකාර නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

9.6 හෙද හා පාසල් දන්ත චිකිත්සක පුහුණුවට අයදුම්කරන අයදුම්කරුවන් අයදුම්පත් එවන දිනය වන විට අවිවාහක විය යුතු අතර, පුහුණුව ලබන කාලය තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්යය වේ.

10. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :-

10.1 පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී, එහෙත් පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා වූ පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරින් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පුහුණුව සාර්ථකව නිමකර අවසන් පරීක්ෂණය සමත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැළකිල්ලට ගෙන අදාළ තනතුරේ III වන පංතියේ තනතුරකට පත් කිරම සඳහා සළකා බලනු ලැබේ. එමෙන්ම තෝරා ගනු ලබන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත්කිරීමට යටත් වේ.

10.2 පුහුණු කාලය අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කළහොත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

10.3 අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැළකිළිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරෙන් පහකරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොග න්නාවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද, පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව රජය විසින් දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

10.4 තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

10.5 ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ චක්‍ර ලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

10.6 පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අය කරනු ලැබේ.

10.7 මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම, පුහුණුවෙන් පසුව ඔබ අදාළ තනතුරේ පත්වීම් ලදහොත්, අනුමැතිය ලබා දී ඇති තනතුරුවල හැර අනෙක් තනතුරු දරන්නන්ට පෞද්ගලික සේවය යෙදීමට කිසිදු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදුකර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

10.8 පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදන මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදාවුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

බී. ජී. එස්. ගුණතිලක,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2018 අගෝස්තු මස 15 වැනි දින,
"සුවසිරිපාය"
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

08-1141

---

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු සහ උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා** - 2018

රජය සහ පෞද්ගලික අංශය පිළිගත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා රැකියා සුලබ ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ ක්ෂේත්‍රයන්ට පිවිසෙන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව**
NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full Time)

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 22,500

**මයික්‍රොසොෆ්ට් ඔෆිස්** - Microsoft Office

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

කාලයඃ මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍යඃ සිංහල හා ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 12,500

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය** - Computer Graphic Design

ග්‍රැෆික්, මුද්‍රණ සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

කාලයः මාස 05 යි (අර්ධ කාලීන) මාධ්‍යය ඃ සිංහල/ ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව ඃ ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 17,000.00 NVQ සහතිකපත් පාඨමාලාව රු. 21,500.00

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම** - Computer Typesetting and Layout Design

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුනු පාඨමාලාවකි.

කාලයः මාස 05යි (අර්ධ කාලීන) මාධ්‍යය ඃ සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව ඃ රු. 13,500

**වෙබ් අඩවි නිර්මාණය** - Web Designing

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලයः මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍යය ඃ සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව ඃ රු. 16,500

**අරේඛිය සංස්කරණය** - Non Linar Editing

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසැල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය ඃ වසරයි. (අර්ධ කාලීන) මාධ්‍යः සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව ඃ රු. 23,000

**ත්‍රිමාණ සජීවිකරණය** - Digital Animation

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනි සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

කාලය ඃ මාස 06යි (අර්ධ කාලීන) මාධ්‍යः සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව ඃ රු. 23,000

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම** - Computer Hardware and Assembly

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබාදෙන අතර එදිනෙදා පැනනගින දෘඩාංග/මෘදුකාංගවල අදළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැලි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

කාලය ඃ මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍යः සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව ඃ රු. 12,500

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම** - Design for Print

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රයෝගිකව මුද්‍රණ දෙන ගැටලු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටම නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

පාඨමාලා කාලය : වසර 1 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 15,500

**පොත් බැඳීම හා නිමාකරණය** - Book Binding and Finishing

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයක් වේ.

කාලය : මාස 07යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 19,000

**Advanced Diploma in Printing Technology and Management**

කාලය : අවුරුදු 2 මාධ්‍ය : ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 140,000

**Advanced Diploma in Visual Communication and Management**

කාලය : අවුරුදු 2 මාධ්‍ය : ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 140,000

ඉහත උසස් ඩිප්ලෝමාවන් දෙක කොළඹ විශ්ව විද්‍යාලය හා එක්ව ආරම්භ කරන අතර එය කොළඹ විශ්ව විද්‍යාලයේ MBA උපාධියට ඇතුළත්වීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලයි.

**නොමිලේ සහභාගි විය හැකි සම්මන්ත්‍රණ මාලාවක්**

ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා තාක්ෂණය සහ ඊට අදළ මෘදුකාංග (Software) භාවිතය පිළිබඳව නොමිලේ සහභාගිවිය හැකි සම්මන්ත්‍රණයක් සැප්තැම්බර් මස 13 වැනි බ්‍රහස්පතින්දා උදේ 8.30 සිට සවස 1.30 දක්වා පැවැත්වෙන අතර පොත් බැඳීම හා නිමාව පහදාදීම පිළිබඳ නොමිලේ සම්මන්ත්‍රණයක් සැප්තැම්බර් මස 14 වැනි සිකුරාදා උදේ 8.30 සිට සවසට 1.30 දක්වා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ශ්‍රවණාගාරයේදී පැවැත්වේ. ඉඩකඩ සීමිත නිසා 011 2686162 හෝ 011 2679791 දුරකතන අංක අමතා ආසනයක් හැකි ඉක්මනින් වෙන්කරවා ගන්න.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂෙත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස් කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන් හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.

දුරකතන : 011 2686162, 011 2679791.

ෆැක්ස් : 011 2686162 ඊ-මේල් : sliopdir@sltnet.lk වෙබ් අඩවිය : www.sliop.edu.lk

*ශාඛා* :- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.

දුරකතන අංක : 066-2222172, 071 0554298.

08-1187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.